AL/2019/74/S-I-E-I(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.09 / 0830 - 1030

පාලි I
பாளி I
Pali I

74 S-T-E I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ **ඔබේ විභාග අංකය** ලියන්න.
- ※ උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොද දක්වන්න.**

**1.** පාලි භාෂාව හැඳින්වීමට පර්යාය නාමයක් **නො වන්නේ** මේවායින් කවරක් ද?
(1) මාගධීභාසා (2) තන්තිභාසා (3) ඉසිභාසා (4) මූලභාසා

**2.** වර්ගාක්ෂර **නොමැති** පදය තෝරන්න.
(1) අල්ලකෙසො (2) අරියස්ස (3) නමස්සති (4) හෙට්ඨිමං

**3.** පාලි භාෂා රීතිය අනුව නිවැරදි ව ලියා ඇති පාඨය මෙයින් කුමක් ද?
(1) ඡන්දා ද්වේෂා භයා මොහා (2) ස ශීලවා පඤ්ඤවා ධම්මිකො සියා
(3) තිස්සො විද්‍යා අනුප්පත්තා (4) න සම්ඤ්ජන්ති පණ්ඩිතා

**4.** **කෙරෙහි** යන අර්ථය දෙන නාම විභක්තිය කුමක් ද?
(1) සත්තමී (2) පඤ්චමී (3) චතුත්ථී (4) තතියා

**5.** "**කාකං සුවණ්ණා පරිවාරයන්ති**" යන්නෙහි නිවැරදි ව්‍යාකරණ විග්‍රහය කුමක් ද?
(1) කර්තෘකාරක, වර්තමානකාලික, ප්‍රථමපුරුෂ වාක්‍යයකි.
(2) කර්තෘකාරක, අනාගතකාලික, ප්‍රථමපුරුෂ වාක්‍යයකි.
(3) කර්මකාරක, වර්තමානකාලික, මධ්‍යමපුරුෂ වාක්‍යයකි.
(4) කර්මකාරක, අනාගතකාලික, උත්තමපුරුෂ වාක්‍යයකි.

● පහත දැක්වෙන ගාථා කියවා **6** සිට **10** තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සට්ඨිවස්සානි මුටසීවො - රාජා රජ්ජමකාරයී,
අනුරාධෙ පුරෙ වරෙ - ලඞ්කාභුවදනෙ සුභෙ.

තස්ස පුත්තා දසා'හෙසුං - අඤ්ඤමඤ්ඤහිතෙසිනො,
දුවෙ ධීතා චා'නුකුලා - කුලානුච්ඡවිකා අහුං.

දෙවානම්පියතිස්සො'ති - විස්සුතො දුතියො සුතො,
තෙසු භාතුසු සබ්බෙසු - පුඤ්ඤපඤ්ඤාධිකො අහූ.

**6.** කො මුටසීවො රාජා අහොසි?
(1) සො අනුරාධපුරෙ විහාසි.
(2) තස්ස ද්වාදස පුත්තා අහෙසුං.
(3) සො දෙවානම්පියතිස්සරඤ්ඤො පිතා අහවි.
(4) විස්සුතො දුතියො සුතො ආසි.

7. තස්ස රඤ්ඤො කති දුහිතාරො අහෙසුං?
(1) සට්ඨි (2) ද්වාදස (3) ද්වෙ (4) එකා

8. මුටසීව රජුගේ පුත්‍රයන් තුළ පැවැති විශේෂ ලක්ෂණයක් වූයේ,
(1) පින් කිරීමට කැමති බව ය.
(2) පින නැණ දෙකෙන් යුක්ත බව ය.
(3) ශ්‍රී ලංකාවට ආදරය කළ බව ය.
(4) එකිනෙකා සමග සුහදව සිටි බව ය.

9. **පුඤ්ඤපඤ්ඤාධිකො** යන පදය
(1) සන්ධියකි. (2) සමාසයකි. (3) තද්ධිතයකි. (4) කිතකයකි.

10. **ලඞ්කාගුවදනෙ** යන්න
(1) අනුප්‍රාසයකි. (2) උපමාවකි. (3) රූපකයකි. (4) සංකේතයකි.

11. "**මාතා පිතා දිසා පුබ්බා - ආචරියා දක්ඛිණා දිසා**..." යනාදි ගාථාවේ අවසාන පාදය මෙයින් කවරක් ද?
(1) අලමත්තො කුලෙ ගිහී (2) උද්ධං සමණබ්‍රාහ්මණා
(3) එතා දිසා නමස්සෙය්‍ය (4) දාසකම්මකරා හෙට්ඨා

12. අට්ඨකථාචාර්ය බුද්ධඝෝෂ හිමියන්ගේ ගුරුවරයාගේ නම
(1) බුද්ධදත්ත හිමි ය. (2) සොභිත හිමි ය.
(3) සංඝමිත්ත හිමි ය. (4) රේවත හිමි ය.

13. '**ස්වාගතං වත මෙ ආසි - බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ**' යන්නෙහි වඩාත් නිවැරදි අන්වය තෝරන්න.
(1) බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ ආසි ස්වාගතං වත මෙ
(2) ආසි වත මෙ බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ ස්වාගතං
(3) බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ වත මෙ ස්වාගතං ආසි
(4) බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ ආසි මෙ ස්වාගතං වත

14. **සතර කර්ම ක්ලේශ** යනු මේවායින් කුමක් ද?
(1) පාණඝාත, අදත්තාදාන, කාමමිච්ඡාචාර, මුසාවාද
(2) ඡන්ද, දොස, භය, මොහ
(3) විකාලවිසිඛාචරියා, සමජ්ජාභිචරණ, ජූතප්පමාදට්ඨානානුයොග, පාපමිත්තානුයොග
(4) කාම, දිට්ඨි, සීලබ්බත, අත්තවාද

15. මොවුන් අතුරෙන් මිත්‍ර ප්‍රතිරූපකයා කවරෙක් ද?
(1) අත්ථක්ඛායී (2) අනුකම්පක (3) අඤ්ඤදත්ථුහර (4) සමානසුඛදුක්ඛ

16. '**සචෙ විහාරෙ සන්තානකං හොති**' යන්නෙහි නිවැරදි තේරුම සහිත වරණය තෝරන්න.
(1) ඉදින් විහාරයෙහි කැලි කසල වේ නම් (2) ඉදින් විහාරය සතු යමක් වේ නම්
(3) ඉදින් විහාරයෙහි මකුළුදැල් වේ නම් (4) ඉදින් විහාරයෙහි සද්ධිවිහාරිකයකු වේ නම්

17. **පඩික්කම** යන අරුත ඇති පාලි පදය මේවායින් කුමක් ද?
(1) බිම්බොහනං (2) භිසි (3) භුම්මත්ථරණං (4) බෙලමල්ලකං

18. කර්මකාරක වාක්‍යයක් වන්නේ මේවායින් කුමක් ද?
(1) සද්ධිවිහාරිකො නහායිතුකාමො හොති. (2) න ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ නිසීදිතබ්බං.
(3) යස්මිං විහාරෙ සද්ධිවිහාරිකො විහරති. (4) විගරහි බුද්ධො භගවා.

19. **ලොකජෙට්ඨො** යන පදය අයත් වන්නේ කවර සමාසයට ද?
(1) අබ්‍යයීභාව (2) කම්මධාරය (3) තප්පුරිස (4) ද්වන්ද

20. මහාවංසය අනුව නිවැරදි ප්‍රකාශයක් **නො වන්නේ** මෙයින් කුමක් ද?
(1) මුටසීව රජුගේ මව සුවණ්ණපාළි නම් වූවා ය.
(2) දෙවනපෑතිස් රජතුමා මුටසීව රජුගේ පියා විය.
(3) මුටසීව රජතුමාට පුත්‍රයෝ දස දෙනෙක් වූහ.
(4) මහාමේඝවන උද්‍යානය කරවන ලද්දේ මුටසීව රජතුමා විසිනි.

[ අනෙක් පිටුව බලන්න/மறுபக்கம் பார்க்க/Please turn over

**21.** සද්ධිවිහාරිකයා විසින් උපාධ්‍යායන් වහන්සේට කළ යුතු වතක් **නො වන්නේ**,
(1) දැහැටි පිළිගැන්වීමයි. (2) මුවදෝනා ජලය පිළිගැන්වීමයි.
(3) අසුන් පැනවීමයි. (4) දැහැමි කථා පැවැත්වීමයි.

**22.** "ස්වාමීනී, එදින උපන් වසු පැටියන්ගෙන් කිරි බොන මහා වැස්සියන් දුටුවෙමි" මහාසුපින ජාතකයෙහි දැක්වෙන මෙම සිහිනයෙන් කියැවෙන අදහසක් වන්නේ, අනාගතයෙහි
(1) දක්ෂ හා උගත් මහළු විනිසුරුවන්ට තනතුරු නොදී, එසේ නො වන තරුණයන් විනිශ්චය කටයුතුවල යොදවන බව ය.
(2) වැඩිහිටියන් ස්වශක්තියෙන් නොව දරුවන් තුටු කොට ඔවුන්ගෙන් යැපෙන බව ය.
(3) අලජ්ජී භික්ෂූන් ප්‍රත්‍යය ලෝලව අනුන්ට ධර්මදේශනා කරන බව ය.
(4) පිරිමි කෙළෙස් වශගයෙන් තරුණ බිරියන්ගේ කීම් අනුව පවතින බව ය.

**23.** ශබ්දානුප්‍රාස රසයෙන් වඩාත් උසස් ගාථා පාදය තෝරන්න.
(1) එකා කුසුමයට්ඨී තු, කුසුමානි තහිං පන
(2) කකුධඵලා පාකතිකා, ඉච්චෙතෙ අට්ඨ ජාතියො
(3) ඵලපුප්ඵතරුපෙතං, සො රාජා කාරයී සුභං
(4) මුත්තා සමුද්දා උග්ගන්ත්වා, තීරෙ වට්ටි වියට්ඨිතා

**24.** ග්‍රන්ථ කතුවරයාට අනුව මහාවංසය රචනා කිරීමෙහි පොදු අරමුණ වී ඇත්තේ,
(1) අනාගතය සඳහා ඉතිහාසය ලියා තැබීමයි.
(2) සත්පුරුෂයන් තුළ ප්‍රසාදය හා සංවේගය ජනනය කිරීමයි.
(3) ශ්‍රී ලාංකිකයන්ගේ ජාතිකාභිමානය වර්ධනය කිරීමයි.
(4) පාලි භාෂාවෙන් කාව්‍ය ග්‍රන්ථයක් රචනා කිරීමයි.

**25.** **සාමඤ්ඤඵල සූත්‍රය** අයත් වන්නේ කවර නිකාය ග්‍රන්ථයකට ද?
(1) දීඝනිකාය (2) මජ්ඣිමනිකාය
(3) සංයුත්තනිකාය (4) අංගුත්තරනිකාය

**26.** බුද්ධවචනය ඡන්දසට නැඟීමට අවසර ඉල්ලූ භික්ෂූන් දෙදෙනා වන්නේ,
(1) අස්සජි - පුනබ්බසුක ය. (2) සාරිපුත්ත - මොග්ගල්ලාන ය.
(3) යමෙළු - තෙලුක ය. (4) මහාකොට්ඨිත - මහාකච්චායන ය.

**27.** උපතිස්ස නම් යතිවරයකු විසින් රචිත පාලි ග්‍රන්ථයක් වන්නේ මෙයින් කුමක් ද?
(1) දාඨාවංසය (2) ථූපවංසය
(3) මහාබොධිවංසය (4) රසවාහිනිය

**28.** දොළහ, තිස්තුන, අනූ නවය යන සංඛ්‍යා නිවැරදි ව පිළිවෙළින් පාලියෙන් ලියා ඇති වරණය තෝරන්න.
(1) බාරස, තිංසති, නවනවුති
(2) ද්වාදස, තෙත්තිංසති, එකූනසත
(3) ද්වාදසමො, තෙතිංසතිමො, නවනවුතිමො
(4) ද්වාදස, එකූනසත, තිතිංසති

**29.** **ගච්ඡන්ත** ශබ්දයේ ඡට්ඨි බහුවචන රූපයක් වන්නේ මෙයින් කුමක් ද?
(1) ගච්ඡතං (2) ගච්ඡන්තස්ස (3) ගච්ඡතො (4) ගච්ඡන්තං

**30.** **ඨිතො** යන්නට ව්‍යාකරණමය වශයෙන් **අසමාන** පදය තෝරන්න.
(1) තතො (2) ගතො (3) සුතො (4) චීතො

**31.** '**අලං වක්කලි කිං රූපෙ**, .............................' යන්නෙහි හිස්තැනට නිර්දිෂ්ට ග්‍රන්ථයේ යෙදී ඇති පාඨය තෝරන්න.
(1) අතිත්තං පියයාමහං (2) මං පස්සම්පි න පස්සති
(3) සුඛෙන පරිවඩ්ඪිතො (4) රමසෙ බාලනන්දිතෙ

**32.** **උදයබ්බයං** යන්නෙන් ප්‍රකාශ වන්නේ කුමක් ද?
(1) උදේ හවස (2) අලුයම ඇති වූ බිය
(3) ඇතිවීම නැතිවීම (4) හිරු බැසයාම

**33.** **පදුමාමලසුච්ඡවි** යන්නෙහි නිවැරදි පද බෙදීම කුමක් ද?
(1) පදු මාමල සුච්ඡවි (2) පදුමා මල සුච්ඡවි
(3) පදුමා මලසු ඡවි (4) පදුම අමල සු ඡවි

**34.** නවංගසත්ථුසාසනයට අයත් **නො වන්නේ** මේවායින් කවරක් ද?
(1) ගෙය්‍ය (2) වෙය්‍යාකරණ (3) වෙදල්ල (4) නිද්දෙස

**35.** පච්චුප්පන්න වත්ථු, අතීත වත්ථු, ගාථා, වෙය්‍යාකරණ සහ සමොධාන යන කරුණු පිළිවෙළින් දක්වා ඇත්තේ,
(1) ධම්මපදට්ඨකථාවේ ය. (2) චරියාපිටකට්ඨකථාවේ ය.
(3) ජාතකට්ඨකථාවේ ය. (4) උදානට්ඨකථාවේ ය.

**36.** සංයුක්ත නිකායේ ඇතුළත් සූත්‍ර සංඛ්‍යාව නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) 152 (2) 7752 (3) 8000 (4) 9556

**37.** **පුත්තදාරා** යනු,
(1) පුත්‍රයන් හා දියණියන් ය. (2) දරුවන් හා බිරිඳ ය.
(3) පුතා හා දියණිය ය. (4) දරුවන් හා මුනුබුරන් ය.

**38.** **සත්තාහං** යන්න අයත් වන්නේ කවර සමාස ප්‍රභේදයට ද?
(1) කම්මධාරය (2) දිගු (3) තප්පුරිස (4) ද්වන්ද

**39.** සංස්කෘත ආභාසය වැඩියෙන් ම ලැබී ඇතැයි සැලකෙන ග්‍රන්ථය මෙයින් කවරක් ද?
(1) හත්ථවනගල්ලවිහාරවංසය (2) ජිනචරිතය
(3) ථූපවංසය (4) සහස්සවත්ථුප්පකරණය

**40.** සංඝයාගේ විනය කර්මයක් **නො වන්නේ** මෙයින් කුමක් ද?
(1) අබ්භාන (2) උක්ඛෙපන
(3) කටත්තා (4) මූලාය පටිකස්සන

**41.** '**රාජා තෙ චතුරො ජනෙ**' යන පාඨයෙහි ඇතුළත් ලඝු-ගුරු සංඛ්‍යාව පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) ලඝු 02 ගුරු 06 (2) ලඝු 03 ගුරු 05
(3) ලඝු 04 ගුරු 04 (4) ලඝු 05 ගුරු 03

**42.** පාසලෙහි දී නිබඳව අනුන් විසින් කෙණහිලිකම් කරද්දී නොසැලී ඉගෙනීමෙහි යෙදී සිටින ශිෂ්‍යයකු වේ. ඔහු අනුගමනය කරන්නේ පහත දැක්වෙන කවර බුදුවදනක් ද?
(1) න භජෙ පාපකෙ මිත්තෙ (2) ධම්මපීති සුඛං සෙති
(3) න සමිඤ්ජන්ති පණ්ඩිතා (4) සබ්බත්ථ වෙ සප්පුරිසා චජන්ති

**43.** 'අහං පන එළකෙ දීපිනො අනුබන්ධිත්වා මුරුමුරුති ඛාදන්තෙ අද්දසං' යන පාඨයෙහි '**මුරුමුරුති**' යන්නෙන් ධ්වනිත වන්නේ,
(1) අනුප්‍රාස රසයකි. (2) අවස්ථා නිරූපණයකි.
(3) සංකේතයකි. (4) උපමාවකි.

**44.** මහාසුපින ජාතකයෙහි පරදාර සේවනයෙහි නියුතු ස්ත්‍රිය සමකොට ඇත්තේ,
(1) මහළු හිවලියකට ය. (2) දෙපස මුඛ ඇති අශ්වයෙකුට ය.
(3) හිස් කළවලට ය. (4) එළදෙනකට ය.

**45.** තමා සතු වස්තුව විනාශ නො වන ලෙස රැක ගැනීමට කළ යුතු වැදගත්ම දේ වන්නේ,
(1) කිසිවකුට නොදී සිටීමයි. (2) දිනපතා පිරිසිදුව තබා ගැනීමයි.
(3) සොර සතුරන්ගෙන් ආරක්ෂා කිරීමයි. (4) අනලස්ව කටයුතු කිරීමයි.

**46.** **අරියස්ස විනයෙ** යන්නෙහි නිවැරදි අර්ථය දැක්වෙන වරණය කුමක් ද?
(1) බුද්ධ ශාසනයෙහි (2) සංඝ සමාජයෙහි
(3) ආර්ය ශීලයෙහි (4) විනය පිටකයෙහි

**47.** **මහාකස්සපචරිත** නම් කෘතියේ කර්තෘවරයා වන්නේ,
(1) පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි ය. (2) පඤ්ඤාසාමි කවිධජ නාහිමි ය.
(3) යගිරල පඤ්ඤානන්ද නාහිමි ය. (4) විදුරුපොල පියතිස්ස නාහිමි ය.

**48.** **මහාවංසයට** යෙදෙන අපර නාමයක් වන්නේ මින් කුමක් ද?
(1) පජ්ජපදොරුවංස (2) වංසත්ථප්පකාසිනී
(3) අභිධානප්පදීපිකා (4) වංසත්ථදීපනී

**49.** පදුමුත්තර නම් බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූයේ මෙයින් කල්ප කීයකට පෙර ද?
(1) දස දහසකට (2) අසූ හාර දහසකට
(3) ලක්ෂයකට (4) ලක්ෂ තුනකට

**50.** බෞද්ධ ඉගැන්වීම අනුව ජීවිතයක් වඩාත් අර්ථවත් වීමට අවශ්‍ය වන්නේ පහත දැක්වෙන කවර ගුණ යුගලය ද?
(1) අලෝභ - අදෝස (2) කරුණා - පඤ්ඤා
(3) සීල - සමාධි (4) හිරි - ඔත්තප්ප

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස.(උ.පෙළ) විභාගය/க.பொ.த. (உயர் தர)ப் பரீட்சை- 2019
නව නිර්දේශය

විෂය අංකය / பாட இலக்கம்: 74
විෂයය / பாடம்: පාලි

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 1 | 21. | 4 | 31. | 4 | 41. | 2 |
| 02. | 2 | 12. | 4 | 22. | 2 | 32. | 3 | 42. | 3 |
| 03. | 4 | 13. | 3 | 23. | 4 | 33. | 4 | 43. | 1 |
| 04. | 1 | 14. | 1 | 24. | 2 | 34. | 4 | 44. | 1 |
| 05. | 1 | 15. | 3 | 25. | 1 | 35. | 3 | 45. | 4 |
| 06. | 3 | 16. | 3 | 26. | 3 | 36. | 2 | 46. | 1 |
| 07. | 3 | 17. | 4 | 27. | 3 | 37. | 2 | 47. | 4 |
| 08. | 4 | 18. | 2 | 28. | 2 | 38. | 2 | 48. | 1 |
| 09. | 2 | 19. | 3 | 29. | 1 | 39. | 1 | 49. | 3 |
| 10. | 3 | 20. | 2 | 30. | 1 | 40. | 3 | 50. | 4 |

✪විශේෂ උපදෙස්/விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ஒரு சரியான விடைக்கு 02ලකුණුබැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50= 100

AL/2019/74/S-T-E-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

පාලි II
பாளி II
Pali II

74 S-T-E II

2019.08.13 / 1300 - 1610

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**வினாத்தாளை வாசித்து, வினாக்களைத் தெரிவுசெய்வதற்கும் விடை எழுதும்போது முன்னுரிமை வழங்கும் வினாக்களை ஒழுங்கமைத்துக் கொள்வதற்கும் மேலதிக வாசிப்பு நேரத்தைப் பயன்படுத்துக.**

Use **additional reading time** to go through the question paper, select the questions and decide on the questions that you give priority in answering.

**උපදෙස්:**

* I කොටසේ **සියලු ම** ප්‍රශ්නවලට ද, II හා III කොටස්වලින් එක් ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ ප්‍රශ්න **තුනක් ද** තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සම්පූර්ණයෙන් **එක් භාෂාවකින්** පමණක් සැපයිය යුතු ය.

## I කොටස

**1.** **සිංහලට** නගන්න.

(i) අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පිණ්ඩාය පාවිසි. අද්දසා ඛො භගවා සිගාලකං ගහපතිපුත්තං කාලස්සෙව උට්ඨාය රාජගහා නික්ඛමිත්වා අල්ලවත්ථං අල්ලකෙසං පඤ්ජලිකං පුථුද්දිසා නමස්සන්තං, පුරත්ථිමං දිසං, දක්ඛිණං දිසං, පච්ඡිමං දිසං, උත්තරං දිසං, හෙට්ඨිමං දිසං, උපරිමං දිසං. දිස්වාන සිගාලකං ගහපතිපුත්තං එතදවොච; කින්නු ඛො ත්වං ගහපතිපුත්ත කාලස්සෙව උට්ඨාය රාජගහා නික්ඛමිත්වා අල්ලවත්ථො අල්ලකෙසො පඤ්ජලිකො පුථුද්දිසා නමස්සසි, පුරත්ථිමං දිසං, දක්ඛිණං දිසං, පච්ඡිමං දිසං, උත්තරං දිසං, හෙට්ඨිමං දිසං, උපරිමං දිසන්ති? පිතා මෙ භන්තෙ, කාලං කරොන්තො එවං අවච, දිසා තාත, නමස්සෙය්‍යාසීති. සො ඛො අහං භන්තෙ, පිතුවචනං සක්කරොන්තො ගරුකරොන්තො මානෙන්තො පූජෙන්තො කාලස්සෙව උට්ඨාය ... පුථුද්දිසා නමස්සාමි.

(දීඝනිකාය)

(ii) ඔවදෙය්‍යානුසාසෙය්‍ය - අසබ්භා ච නිවාරයෙ,
සතං හි සො පියො හොති - අසතං හොති අප්පියො.

න භජෙ පාපකෙ මිත්තෙ - න භජෙ පුරිසාධමෙ,
භජෙථ මිත්තෙ කල්‍යාණෙ - භජෙථ පුරිසුත්තමෙ.

ධම්මපීති සුඛං සෙති - විප්පසන්නෙන චෙතසා,
අරියප්පවෙදිතෙ ධම්මෙ - සදා රමති පණ්ඩිතො.

උදකං හි නයන්ති නෙත්තිකා - උසුකාරා නමයන්ති තෙජනං,
දාරුං නමයන්ති තච්ඡකා - අත්තානං දමයන්ති පණ්ඩිතා.

සෙලො යථා එකඝනො - වාතෙන න සමීරති,
එවං නින්දාපසංසාසු - න සමිඤ්ජන්ති පණ්ඩිතා.

(ධම්මපදය)

(ලකුණු 10 + 10 = 20)

[ අනෙක් පිටුව බලන්න/மறுபக்கம் பார்க்க/Please turn over

**2.** (i) **සිංහලට** නගන්න.

හන්තෙ, මහන්තමහන්තා කූටාගාරප්පමාණා සනසිලා නාවා විය උදකෙ ප්ලවමානා අද්දසං. ඉමස්ස කො විපාකොති. ඉමස්සාපි තාදිසෙයෙව කාලෙ විපාකො භවිස්සති. තදා හි අධම්මිකරාජානො අකුලීනානං යසං දස්සන්ති. තෙ ඉස්සරා භවිස්සන්ති. කුලීනා දුග්ගතා. තෙසු න කෙචි ගාරවං කරිස්සන්ති. ඉතරෙසු යෙව කරිස්සන්ති. රාජසම්මුඛෙ වා අමච්චසම්මුඛෙ වා විනිච්ඡයට්ඨානෙ වා විනිච්ඡයකුසලානං සනසිලාසදිසානං කුලපුත්තානං කථා න ඔගාහිත්වා පතිට්ඨහිස්සන්ති. තෙසු කථෙන්තෙසු කිං ඉමෙ කථෙන්තී'ති ඉතරෙ පරිහාසමෙව කරිස්සන්ති. භික්ඛුසන්නිපාතෙපි වුත්තප්පකාරෙසු ඨානෙසු නෙව පෙසලෙ භික්ඛූ ගරුකාතබ්බෙ මඤ්ඤිස්සන්ති. නාපි තෙසං කථා පරියොගාහිත්වා පතිට්ඨහිස්සන්ති. සිලානං ප්ලවනකාලො විය භවිස්සති.

(ජාතකට්ඨකථා)

(ii) **පාලියට** නගන්න.

(අ) හෙට අපි සිල්වතුන් වදින්නෙමු.

(ආ) 'මහරජ, මෙයින් ඔබට බියක් නැත.'

(ඉ) තෙපි මුනිවරුන්ට ආහාර දුන්නෙහු.

(ඊ) සොරා ගමෙන් නො දිව්වේ ය.

(උ) මනුෂ්‍යයෝ දානාදී පින්කම් කොට ස්වර්ගයේ උපදිති.

(ලකුණු 10 + 10 = 20)

## II කොටස

**3.** (i) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තෙන ඛො පන සමයෙන සද්ධිවිහාරිකා උපජ්ඣායෙසු න සම්මා වත්තන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, කථං හි නාම සද්ධිවිහාරිකා උපජ්ඣායෙසු න සම්මා වත්තිස්සන්තී'ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. සච්චං කිර භික්ඛවෙ සද්ධිවිහාරිකා උපජ්ඣායෙසු න සම්මා වත්තන්තී'ති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා; කථං හි නාම භික්ඛවෙ සද්ධිවිහාරිකා උපජ්ඣායෙසු න සම්මා වත්තිස්සන්ති, නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය, පසන්නානං වා භියොභාවාය. අථ ඛො තං භික්ඛවෙ අප්පසන්නානං චෙව අප්පසාදාය, පසන්නානං ච එකච්චානං අඤ්ඤථත්තායාති විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි.

(අ) මෙහි කියැවෙන අර්බුදය කුමක් සම්බන්ධයෙන් ඇති වූවක් ද?

(ආ) සුපේශල භික්ෂුවකගේ ගති ලක්ෂණ කියැවෙන පද **හතරක්** ඡේදයෙන් උපුටා දක්වන්න.

(ඉ) පහත දැක්වෙන අදහස් පැවසීමට මෙම පාඨයෙහි යෙදෙන පාලි වචන දක්වන්න.

| | |
|---|---|
| (1) අප්‍රසාදය පිණිස | (4) ගර්හා කොට |
| (2) ඇතැමුන්ගේ | (5) මෙම කරුණ |
| (3) උද්ඝෝෂණය කරති | (6) වැඩිවීම සඳහා |

(ඊ) බුදුන් වහන්සේ පෙන්වා දෙන පරිදි සද්ධිවිහාරික භික්ෂූන්ගේ ක්‍රියාකලාපය වැරදි සහිත වන්නේ කවර හේතු නිසාදැ'යි පැහැදිලි කරන්න.

(ii) පහත සඳහන් වාක්‍යවල **සදොස් තැන් ඇතොත් නිදොස් කොට** නැවත ලියන්න.

(අ) රාජා උය්‍යානස්ස ගන්ත්වා එකමන්තං නිසින්නා පුච්ඡි.

(ආ) එවං වුත්තෙ සිගාලං ගහපතිපුත්තං භගවන්තං එතදවොච.

(ඉ) එවමෙව භගවා අනෙකපරියායෙන ධම්මං පකාසිතො.

(ඊ) තදා අහං හංසවතියස්මිං බ්‍රාහ්මණකුලෙ ආසි.

(උ) ගොතමො නාමෙන සත්ථු ලොකස්ස භවිස්සති.

(ලකුණු 10 + 10 = 20)

**4.** (i) ශ්‍රාවකභාෂිත ලෙස සැලකෙන සූත්‍ර දේශනා **හතරක්** නම් කරන්න.

(ii) තථාගතයන් වහන්සේගේ පූර්ව භවයන් පිළිබඳ දැක්වෙන ඛුද්දකනිකායාගත ග්‍රන්ථ **හතරක්** ලියා දක්වන්න.

(iii) ඉතිහාසයේ දුෂ්කර අවස්ථාවන්හි දී ශ්‍රී ලංකාවේ භික්ෂූන් විසින් ත්‍රිපිටකය රැකගනු ලැබූ අයුරු පැහැදිලි කරන්න.

(iv) පහත දැක්වෙන ග්‍රන්ථවලින් **දෙකක** කර්තෘ, කාලය හා අන්තර්ගතය කෙටියෙන් ගෙනහැර දක්වන්න.

(අ) කථාවත්ථුප්පකරණය (ඉ) ජිනචරිතය

(ආ) දාඨාවංසය (ඊ) රසවාහිනී (ලකුණු 2+4+6+8=20)

**5.** (i) "සබ්බත්ථ වෙ සප්පුරිසා චජන්ති - න කාමකාමා ලපයන්ති සන්තො,
සුඛෙන ඵුට්ඨා අථ වා දුඛෙන - නොච්චාවචං පණ්ඩිතා දස්සයන්ති."
මෙම ගාථාව ඇසුරෙන් බුද්ධිමත් පුද්ගලයකුගේ චරිත විශේෂතා පිළිබඳ ව විවරණයක් කරන්න.

(ii) "යො හි පස්සති සද්ධම්මං, සො මං පස්සති පණ්ඩිතො" මෙහි ධර්මානුකූල අදහස පැහැදිලි කරන්න.

(iii) අතීතයේ ශ්‍රී ලංකාව හා භාරතය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ගොඩනැගී ඇති ආකාරය මහාවංසය ඇසුරෙන් පෙන්වා දෙන්න.

(iv) අපායසහායක අමිත්‍රයාගේ ගති ලක්ෂණ ප්‍රකට කරන්න.

(ලකුණු 5+5+5+5 =20)

## III කොටස

**6.** (i) පහත දැක්වෙන පදවල තේරුම ලියා දක්වන්න.

(අ) අජ්ජතග්ගෙ (ඌ) තොයෙන

(ආ) අත්‍රජො (එ) ඝධාපිතා

(ඉ) චතුධා (ඒ) දිවාසොප්පං

(ඊ) උස්සූරසෙය්‍යා (ඔ) සාපතෙය්‍යං

(උ) කායබන්ධනං (ඕ) ස්වාගතං

(ii) පහත වචනවලට නිර්දිෂ්ට ග්‍රන්ථවල ඇති **පාලි යෙදුම** දක්වන්න.

(අ) අත් පිස්නාව (ඌ) බෑණා

(ආ) උපාධ්‍යායන් වහන්සේ (එ) මිත්‍ර ප්‍රතිරූපකයෝ

(ඉ) දැහැටි දඬු (ඒ) යට දිශාව

(ඊ) දූවිලි සහිත සුළඟ (ඔ) වල්විදුනාව

(උ) පඬුරු (ඕ) හිවළා

(iii) පහත ක්‍රියා රූපවල අඛ්‍යාත විභක්තිය, පුරුෂය හා වචනය නම් කරන්න.
උදාහරණ:- **භවති** - වත්තමානා, පඨමපුරිස, ඒකවචන

(අ) ආරොචෙසිං

(ආ) ඔවදෙය්‍ය

(ඉ) නමස්සසි

(ඊ) නයන්ති

(උ) තිට්ඨතු

[ අනෙක් පිටුව බලන්න/மறுபக்கம் பார்க்க/Please turn over

(iv) පහත නාම පදයන්හි **ශබ්ද ප්‍රකෘතිය** හා **විභක්තිය** නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| (අ) | අම්භාකං | (ඌ) | භික්ඛවෙ |
| (ආ) | එතාදිසො | (එ) | මහෙසිනො |
| (ඉ) | ගච්ඡන්තං | (ඒ) | මෙධාවිං |
| (ඊ) | ගොතමස්ස | (ඔ) | සීලවා |
| (උ) | පරිසායං | (ඕ) | හංසවතියං |

(ලකුණු 5+5+5+5 =20)

**7.** (i) "**තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය...**" යනාදි ගාථාව නිවැරදි අක්ෂර වින්‍යාසය හා පද බෙදීම් සහිත ව ලියා දක්වන්න.

(ii) පහත පාඨයන්හි හිස්තැන් දී ඇති පද යොදා සම්පූර්ණ කරන්න.
(ආපදාසු, බුද්ධකො, සුක්කං, උපජ්ඣායෙන, අප්පෙන)

(අ) කණ්හං ධම්මං විප්පහාය, ................................ පණ්ඩිතො.

(ආ) ................................ භික්ඛවෙ සද්ධිවිහාරිකම්හි සම්මා වත්තිතබ්බං.

(ඉ) තදඤ්ඤං බුද්ධවචනං නිකායො ................................ මතො.

(ඊ) චතුත්ථං ච නිධාපෙය්‍ය, ................................ භවිස්සති.

(උ) අඤ්ඤදත්ථුහරො හොති, ........................ බහුම්ච්ඡති.

(iii) පහත පදවලින් **දෙකකට** විවරණ සපයන්න.

| | | | |
|---|---|---|---|
| (අ) | අපායමුඛානි | (ඉ) | උභතො විභංග |
| (ආ) | පෙය්‍යවජ්ජං | (ඊ) | ඡන්දාගති |

(iv) මහාසුපින ජාතකයෙන් වර්තමාන සමාජයට ලබාදෙන උපදේශය කුමක්දැ'යි පෙන්වා දෙන්න.

(ලකුණු 5+5+5+5 =20)

## I කොටස

**1. සිංහලට** නගන්න.

(i) අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පිණ්ඩාය පාවිසි. අද්දසා ඛො භගවා සිගාලකං ගහපතිපුත්තං කාලස්සෙව උට්ඨාය රාජගහා නික්ඛමිත්වා අල්ලවත්ථං අල්ලකෙසං පඤ්ජලිකං පුථුද්දිසා නමස්සන්තං, පුරත්ථිමං දිසං, දක්ඛිණං දිසං, පච්ඡිමං දිසං, උත්තරං දිසං, හෙට්ඨිමං දිසං, උපරිමං දිසං. දිස්වාන සිගාලකං ගහපතිපුත්තං එතදවොච; කින්නු ඛො ත්වං ගහපතිපුත්ත කාලස්සෙව උට්ඨාය රාජගහා නික්ඛමිත්වා අල්ලවත්ථො අල්ලකෙසො පඤ්ජලිකො පුථුද්දිසා නමස්සසි, පුරත්ථිමං දිසං, දක්ඛිණං දිසං, පච්ඡිමං දිසං, උත්තරං දිසං, හෙට්ඨිමං දිසං, උපරිමං දිසන්ති? පිතා මෙ භන්තෙ, කාලං කරොන්තො එවං අවච, දිසා තාත, නමස්සෙය්‍යාසීති. සො ඛො අහං භන්තෙ, පිතුවචනං සක්කරොන්තො ගරුකරොන්තො මානෙන්තො පූජෙන්තො කාලස්සෙව උට්ඨාය ... පුථුද්දිසා නමස්සාමි.

(දීඝනිකාය)

**(i) ආදර්ශ පරිවර්තනය**

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පාසිවුරු ගෙන රජගහනුවරට පිඬු පිණිස පිවිසි සේක. භාග්‍යවතුන් වහන්සේ කල් ඇතුවම නැගිට රජගහනුවරින් නික්ම, තෙත් වූ වස්ත්‍ර ඇතිව තෙත් වූ කෙස් ඇතිව(දෙ අත් මුදුනේ තබා) ඇඳිලි බැඳගෙන නැගෙනහිර දිශාව, දකුණු දිශාව, බස්නාහිර දිශාව, උතුරු දිශාව, යට දිශාව, උඩ දිශාව යන ඒ ඒ දිශාවන් නමස්කාර කරන්නා වූ සිගාලක නම් ගෘහපති පුත්‍රයා දුටු සේක. දැක සිගාලක ගෘහපති පුත්‍රයාට මෙය වදාළ සේක. කිම ගෘහපති පුත්‍රය නුඹ කල් ඇතුවම අවදි වී රජගහනුවරින් නික්ම තෙත් වූ වස්ත්‍ර ඇත්තේ තෙත් වූ කෙස් ඇත්තේ (දෙ අත් මුදුනේ තබා) ඇඳිලි බැඳගෙන නැගෙනහිර දිශාව, දකුණු දිශාව, බස්නාහිර දිශාව, උතුරු දිශාව, යට දිශාව, උඩ දිශාව යන ඒ ඒ දිශාවන් නමස්කාර කරන්නෙහි ද? ස්වාමීනී, මාගේ පියා කළුරිය කරන්නේ මෙසේ කීවේය. දරුව, දිසාවන් නමස්කාර කරන්නෙහි නම් මැනවි යනුවෙනි. ස්වාමීනී, ඒ මම වනාහි පියාගේ වචනයට සත්කාර කරන්නේ, ගරු කරන්නේ, බුහුමන් කරන්නේ, පූජා කරන්නේ කල් ඇතුවම නැගිට.... ඒ ඒ දිශාවන් නමස්කාර කරන්නෙමි.

(ii) ඔවදෙය්‍යානුසාසෙය්‍ය - අසබ්භා ච නිවාරයෙ,
සතං හි සො පියො හොති - අසතං හොති අප්පියො.

න භජෙ පාපකෙ මිත්තෙ - න භජෙ පුරිසාධමෙ,
භජෙථ මිත්තෙ කල්‍යාණෙ - භජෙථ පුරිසුත්තමෙ.

ධම්මපීති සුඛං සෙති - විප්පසන්නෙන චෙතසා,
අරියප්පවෙදිතෙ ධම්මෙ - සදා රමති පණ්ඩිතො.

උදකං හි නයන්ති නෙත්තිකා - උසුකාරා නමයන්ති තෙජනං,
දාරුං නමයන්ති තච්ඡකා - අත්තානං දමයන්ති පණ්ඩිතා.

සෙලො යථා එකඝනො - වාතෙන න සමීරති,
එවං නින්දාපසංසාසු - න සමිඤ්ජන්ති පණ්ඩිතා.

(ධම්මපදය)

(ලකුණු 10 + 10 = 20)

**(ii) ආදර්ශ පරිවර්තනය**

(යම් කලණ මිතුරෙක් කිසිවෙකුට) අවවාද දෙන්නේ නම්, අනුශාසනා කරන්නේ නම් අකුසල ධර්මයෙන් ද වළක්වන්නේ නම් ඔහු වනාහි බුද්ධාදි සත්පුරුෂයන්ට ප්‍රිය වෙයි. අසත්පුරුෂයින්ට අප්‍රිය වෙයි.

පවිටු මිතුරන් ආශ්‍රය නොකරන්නේය. අධම පුරුෂයන් ආශ්‍රය නොකරන්නේය. කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරව්. උත්තම පුරුෂයන් ඇසුරු කරව්.

ධර්මරසය බොන තැනැත්තා සුවසේ නිදයි. පණ්ඩිතයා වෙසෙසින් පහන් සිතින් බුද්ධාදි ආර්යයන් විසින් දේශනා කරන ලද ධර්මයෙහි හැමකල්හි ඇලෙයි.

දියාලුවෝ වනාහි තමන් කැමති තැනට ජලය ගෙන යති. හී වඩුවෝ හී දඬු නමති. ලී වඩුවෝ දැව නමති. නුවණැත්තෝ තමන් දමනය කරති.

ඒක ඝණ වූ පර්වතය ප්‍රචණ්ඩ වූ වාතයෙන් යම් සේ නොසැලේ ද, මෙසේ නුවණැත්තෝ නින්දා ප්‍රශංසා දෙකෙහි නොසැලෙති.

**ලකුණු දීමේ ක්‍රමය**

(i) පාඨය සිංහලට නැගීමේ දී නිවැරදි අර්ථ අවබෝධය සඳහා ලකුණු **අටක්** ද, එහි නිවැරදි සිංහල ව්‍යාකරණය සඳහා ලකුණු **දෙකක්ද** පිරිනමන්න. දුෂ්කර පද අත්හරිමින් හා මනඃකල්පිතව කර ඇති පරිවර්තන සඳහා සුදුසු පරිදි ලකුණු අඩු කරන්න.

(ii) කොටසට ලකුණු දීමේ දී එක් ගාථාවකට ලකුණු **දෙක** බැගින් සලකා පළමු පාඨයට ලකුණු ප්‍රදානය කළ ආකාරයට ලකුණු දිය යුතුය.

2. සිංහලට නගන්න.

**2.** (i) **සිංහලට** නගන්න.

හන්තෙ, මහන්තමහන්තා කූටාගාරප්පමාණා සනසිලා නාවා විය උදකෙ ප්ලවමානා අද්දසං. ඉමස්ස කො විපාකොති. ඉමස්සාපි තාදිසෙයෙව කාලෙ විපාකො භවිස්සති. තදා හි අධම්මිකරාජානො අකුලීනානං යසං දස්සන්ති. තෙ ඉස්සරා භවිස්සන්ති. කුලීනා දුග්ගතා. තෙසු න කෙචි ගාරවං කරිස්සන්ති. ඉතරෙසු යෙව කරිස්සන්ති. රාජසම්මුඛෙ වා අමච්චසම්මුඛෙ වා විනිච්ඡයට්ඨානෙ වා විනිච්ඡයකුසලානං සනසිලාසදිසානං කුලපුත්තානං කථා න ඔගාහිත්වා පතිට්ඨහිස්සන්ති. තෙසු කථෙන්තෙසු කිං ඉමෙ කථෙන්තී'ති ඉතරෙ පරිහාසමෙව කරිස්සන්ති. භික්ඛුසන්නිපාතෙපි වුත්තප්පකාරෙසු ඨානෙසු නෙව පෙසලෙ භික්ඛූ ගරුකාතබ්බෙ මඤ්ඤිස්සන්ති. නාපි තෙසං කථා පරියොගාහිත්වා පතිට්ඨහිස්සන්ති. සිලානං ප්ලවනකාලො විය භවිස්සති.

(ජාතකට්ඨකථා)

**(i)** ආදර්ශ පරිවර්තනය

ස්වාමීනි, මහත් මහත් කුළු ගෙවල් පමණ මහ ගල් නැව් මෙන් දියෙහි ඉල්පෙනු දුටිමි. මෙහි විපාකය කවරක්ද? යනුවෙනි. මෙහි ද විපාකය එබඳු වූ ම කාලයෙහි වන්නේ ය. එකල වනාහි අධාර්මික රජවරු අකුලීනයන්ට යසස දෙන්නාහ. ඔවුහු ඉසුරුමත්හු වන්නාහ. කුලීනයෝ දුප්පත් වූවාහු වන්නාහ. කිසිවෙක් ඔවුන් කෙරෙහි ගෞරව නොකරන්නාහ. සෙසු අකුලීනයන් කෙරෙහිම ගෞරව කරන්නාහ. රජ හමුවෙහි හෝ ඇමතියන් හමුවෙහි හෝ විනිශ්චය ස්ථානයෙහි හෝ විනිශ්චයෙහි දක්ෂ වූ ඝන සිලා හා සමාන වූ කුල පුත්‍රයන්ගේ කථා බැසගෙන (සැලකිය යුතු ලෙස) නො පිහිටන්නේය. ඔවුන් කථා කරන කල්හි මොවුහු කුමක් කියත්දැයි සෙස්සෝ පරිහාසයම කරන්නාහ. භික්ෂූන් එක්රැස් වූ තැන්හිදී ද ඉහත කී ආකාරයේ තැන්වල ද ප්‍රියශීලී වූ භික්ෂූන් ගරුකටයුත්තන් කොටම නොසිතන්නාහුමය. ඔවුන්ගේ කථා ද හාත්පසින් නොගෙන පිහිටන්නේය. ගල් ඉල්පෙන කාලය මෙන් වන්නේ ය.

(ii) **පාලියට** නගන්න.

(අ) හෙට අපි සිල්වතුන් වඳින්නෙමු.
(ආ) 'මහරජ, මෙයින් ඔබට බියක් නැත.'
(ඉ) තෙපි මුනිවරුන්ට ආහාර දුන්නෙහු.
(ඊ) සොරා ගමෙන් නො දිව්වේ ය.
(උ) මනුෂ්‍යයෝ දානාදී පින්කම් කොට ස්වර්ගයේ උපදිති.

(ලකුණු 10 + 10 = 20)

**(ii)** ආදර්ශ පරිවර්තනය

(අ) සුවෙ මයං සීලවන්තෙ වන්දිස්සාම.
(ආ) 'මහාරාජ, ඉතො තුය්හං භයං නත්ථි.'
(ඉ) තුම්හෙ මුනීනං ආහාරං දදිත්ථ.
(ඊ) චොරො ගාමා න ධාවි.
(උ) මනුස්සා දානාදීනි පුඤ්ඤානි කත්වා සග්ගෙ උප්පජ්ජන්ති.

**ලකුණු දීමේ ක්‍රමය**

(i) මෙම කොටසට ලකුණු දීමේ දී 01 ප්‍රශ්නයේ පාඨයට ලකුණු දීමේ දී අනුගමනය කළ ක්‍රමවේදය අනුගමනය කරන්න.

(ii) කොටසට ලකුණු දීමේ දී නිවැරදි එක් වාක්‍යයකට ලකුණු **දෙක** බැගින් හිමි වේ. **දෝෂ එකක්** ඇත්නම් වාක්‍යයකට උපරිමය ලකුණු එකකි. **දෝෂ එකකට** වඩා ඇත්නම් ලකුණු හිමි නොවේ. සමස්තයේ වචන භාවිතය සළකා ලකුණු දෙන්නේ නම් ලකුණු 04 උපරිමය ලෙස සළකන්න

## II කොටස

**3.** (i) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තෙන ඛො පන සමයෙන සද්ධිවිහාරිකා උපජ්ඣායෙසු න සම්මා වත්තන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, කථං හි නාම සද්ධිවිහාරිකා උපජ්ඣායෙසු න සම්මා වත්තිස්සන්තී'ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. සච්චං කිර භික්ඛවෙ සද්ධිවිහාරිකා උපජ්ඣායෙසු න සම්මා වත්තන්තී'ති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා; කථං හි නාම භික්ඛවෙ සද්ධිවිහාරිකා උපජ්ඣායෙසු න සම්මා වත්තිස්සන්ති, නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය, පසන්නානං වා භියොභාවාය. අථ ඛො තං භික්ඛවෙ අප්පසන්නානං චෙව අප්පසාදාය, පසන්නානං ච එකච්චානං අඤ්ඤථත්තායාති විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි.

(අ) මෙහි කියැවෙන අර්බුදය කුමක් සම්බන්ධයෙන් ඇති වූවක් ද?

(ආ) සුපේශල භික්ෂුවකගේ ගති ලක්ෂණ කියැවෙන පද **හතරක්** ඡේදයෙන් උපුටා දක්වන්න.

(ඉ) පහත දැක්වෙන අදහස් පැවසීමට මෙම පාඨයෙහි යෙදෙන පාලි වචන දක්වන්න.

| | |
|---|---|
| (1) අප්‍රසාදය පිණිස | (4) ගර්හා කොට |
| (2) ඇතැමුන්ගේ | (5) මෙම කරුණ |
| (3) උද්ඝෝෂණය කරති | (6) වැඩිවීම සඳහා |

(ඊ) බුදුන් වහන්සේ පෙන්වා දෙන පරිදි සද්ධිවිහාරික භික්ෂූන්ගේ ක්‍රියාකලාපය වැරදි සහිත වන්නේ කවර හේතු නිසාදැ'යි පැහැදිලි කරන්න.

(ii) පහත සඳහන් වාක්‍යවල **සදොස් තැන් ඇතොත් නිදොස් කොට** නැවත ලියන්න.

(අ) රාජා උය්‍යානස්ස ගන්ත්වා එකමන්තං නිසින්නා පුච්ඡි.

(ආ) එවං වුත්තෙ සිගාලං ගහපතිපුත්තං භගවන්තං එතදවොච.

(ඉ) එවමෙව භගවා අනෙකපරියායෙන ධම්මං පකාසිතො.

(ඊ) තදා අහං හංසවතියස්මිං බ්‍රාහ්මණකුලෙ ආසි.

(උ) ගොතමො නාමෙන සත්ථු ලොකස්ස භවිස්සති.

(ලකුණු 10 + 10 = 20)

**(1) ආදර්ශ පිළිතුර**

(අ) සද්ධිවිහාරික භික්ෂූන් උපාධ්‍යාය තෙරවරුන් කෙරෙහි මනාව නොපැවතීම නිසා භික්ෂූන් අතරෙහි කලබලයක් ඇතිවීම

(ආ) අප්පිච්ඡා, ලජ්ජිනො, සන්තුට්ඨා, කුක්කුච්චකා, සික්ඛාකාමා,

(ඉ) (1) අප්‍රසාදය පිණිස - අප්පසාදාය

(2) ඇතමුන්ගේ - එකච්චානං

(3) උද්ඝෝෂණය කරති - උජ්ඣායන්ති

(4) ගර්හා කොට - විගරහිත්වා

(5) මෙම කරුණ - එතමත්ථං

(6) වැඩිවීම සඳහා - භියොභාවාය

(ඊ) සද්ධි විහාරිකයන්ගේ ක්‍රියාව වැරදි වන්නේ පහත හේතූන් නිසාය.

- නොපැහැදුණවුන්ගේ පැහැදීමට හේතුවක් නොවීම
- පැහැදුනවුන්ගේ පැහැදීම වැඩිදියුණුවට හේතු නොවීම
- නොපැහැදුණවුන්ගේ අප්‍රසාදයට හේතුවීම
- පැහැදුණු ඇතැමුන්ගේ වෙනස්වීමට හේතු වීම යනාදී කරුණු ඇසුරෙන් පිළිතුර පැහැදිලි කළ යුතුය.

**ලකුණුදීමේ ක්‍රමය**

(ලකුණු 1+2+3+4= 10)

(අ) නිවැරදි පිළිතුරට **ලකුණු එකකි.**

(ආ) නිවැරදි එක් උපුටා දැක්වීමකට **ලකුණ භාගය** බැගින් **ලකුණු** 02කි.

(ඉ) එක් පාලි වචනයකට ලකුණු භාගය බැගින් **ලකුණු** 03කි.

(ඊ) අදාළ කරුණු **හතර** ඇසුරෙන් පැහැදිලි කර ඇති පිළිතුරට **ලකුණු 4ක්** පිරිනමන්න.

(ii) (අ) රාජා උය්‍යානං ගන්ත්වා එකමන්තං **නිසින්නො** පුච්ඡි.

(ආ) එවං වුත්තෙ **සිගාලො ගහපතිපුත්තො** භගවන්තං එතදවොච.

(ඉ) එවමෙව **භගවතා** අනෙකපරියායෙන **ධම්මො** පකාසිතො.

(ඊ) තදා අහං **හංසවතියං** බ්‍රාහ්මණපුත්තො **ආසිං.**

(උ) ගොතමො නාමෙන **සත්ථා ලොකෙ** භවිස්සති.

**ලකුණු දීමේ ක්‍රමය**

එක් නිදොස් කිරීමකට **ලකුණු** භාගය බැගින් **ලකුණු 5කි.** වෙනත් පද වෙනස් කර වාක්‍යය සකසා ඇති විට ලකුණු හිමි නොවේ.

4\. (i) ශ්‍රාවකභාෂිත ලෙස සැලකෙන සූත්‍ර දේශනා **හතරක්** නම් කරන්න.

(ii) තථාගතයන් වහන්සේගේ පූර්ව භවයන් පිළිබඳ දැක්වෙන ඛුද්දකනිකායාගත ග්‍රන්ථ **හතරක්** ලියා දක්වන්න.

(iii) ඉතිහාසයේ දුෂ්කර අවස්ථාවන්හි දී ශ්‍රී ලංකාවේ භික්ෂූන් විසින් ත්‍රිපිටකය රැකගනු ලැබූ අයුරු පැහැදිලි කරන්න.

(iv) පහත දැක්වෙන ග්‍රන්ථවලින් **දෙකක** කර්තෘ, කාලය හා අන්තර්ගතය කෙටියෙන් ගෙනහැර දක්වන්න.

(අ) කථාවත්ථුප්පකරණය (ඉ) ජිනචරිතය

(ආ) දාඨාවංසය (ඊ) රසවාහිනී (ලකුණු 2+4+6+8=20)

**ආදර්ශ පිළිතුර**

(i) **දීඝනිකාය** - සම්පසාදනීය සූත්‍රය, සංගීති සූත්‍රය, දසුත්තර සූත්‍රයඃ සුභසූත්‍රය, පායාසිරාජඤ්ඤ සූත්‍රය.

**මජ්ඣිමනිකාය** - ධම්මදායාදසුත්ත, අනංගණසුත්ත, සම්මාදිට්ඨිසුත්ත, අනුමානසුත්ත, මධුපිණ්ඩිකසුත්ත, මහාහත්ථිපදොපමසුත්ත, මහාගොසිංහසුත්ත, මහාවෙදල්ලසුත්ත, චූල්ලවෙදල්ලසුත්ත, අට්ඨකනාගරසුත්ත, සෙඛසුත්ත, ගුලිස්සානිසුත්ත, සන්දකසුත්ත, මාධුරකසුත්ත, බාහිතිකසුත්ත, ඝොටමුඛසුත්ත, ධනංජානිසුත්ත, ගොපකමොග්ගල්ලානසුත්ත, බක්කුලසුත්ත, අනුරුද්ධසුත්ත, උද්දෙසවිභංගසුත්ත, සච්චවිභංගසුත්ත, අනාථපිණ්ඩිකොවාදසුත්ත, ඡන්නොවාදසුත්ත

(ii) ජාතකපාළි, චරියාපිටක, බුද්ධවංස, අපදානපාළි.

(iii) ඉතිහාසයේ ඉතා දුෂ්කර අවස්ථාවන්හිදී ලාංකික භික්ෂූන් මහත් වෙහෙසක් ගෙන ත්‍රිපිටක ධර්මය රැකගත් අයුරු පහත කරුණු ඇසුරෙන් විස්තර කළ යුතුය. බැමිණිතියා සාය සමයෙහිත්‍රිපිටක භාණකවරු දෙකොටසක් වී කණ්ඩායමක් දඹදිවට ගොස් ධර්මය රැක ගැනීම කණ්ඩායමක් මෙහිම වසමින් දුෂකරතා මැද ධර්මය රැක ගැනීම. මෙහි වැඩසිටි තෙරවරු හැටනමක් සිටගෙන හෝ ඉඳගෙන හෝ ධර්ම සජ්ඣායනා කිරීම්, වනපොත් කිරීම් නොකළ හැකි හෙයින් වැලි ගොඩක් ගසා එය වටේ වැතිර ධර්මය ආරක්ෂා කිරීම. ඉසිදත්ත, මහාසෝණ වැනි තෙරවරු මීගෙඩිවල පොතු මානෙල්දඬු වැනි දෑ වළඳමින් ධර්මය රැක ගැනීම. මහාරක්ඛිත වැනි තෙරවරු දුලබ මහානිද්දේස වැනි ග්‍රන්ථ දුශ්ශීල භික්ෂූන්ගෙන් පවා ඉගෙන ධර්මය රැක ගැනීමට දායක වීම. මහාභය හෙවත් බැමිණිතියා සායෙන් පසු මණ්ඩලාරාමයට යළි රැස්ව බුද්ධ වචනය පිළිබඳ තම මතකය සසඳා බලා නිවැරදි බව තහවුරු කරගැනීම. අනාගතයෙහි මෙබඳු ව්‍යසනයක් වේ යැයි බියෙන් ධර්මය ග්‍රන්ථාරූඪ කිරීමට තීරණය කිරීම

(iv) (අ) **කථාවත්ථුප්පකරණය.**

කර්තෘ - මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ.

කාලය - බුද්ධ පරිනිර්වාණයෙන් අවුරුදු 218 ට පසු.

අන්තර්ගතය - මෙහි පරවාද 500ක් ඛණ්ඩනය කොට සකවාද 500ක් උද්දීපනය කොට ඇත. වජ්ජිපුත්‍රකාදී අන්‍ය නිකායිකයන් විසින් උපදවන ලද පුද්ගලවාදය බිඳීම සඳහා තෙරණුවෝ තමන් වහන්සේම ප්‍රශ්න උපදවා ඒවාට උත්තර දීමෙන් මේ පොත සංග්‍රහ කර තිබේ. මෙහි වර්ග 23ක් හා කථා 217ක් අන්තර්ගතය.

(ආ) දාඨාවංසය

කර්තෘ - රාජගුරු ධම්මකිත්ති නම් හිමි නමකි

කාලය - බු. ව. 1762, (ක්‍රි. ව. 1208 . 1211), පොළොන්නරු යුගයේ, ලීලාවතී රැජිනගේ රාජ්‍ය කාලයේ.

අන්තර්ගතය - මෙහි පරිච්ඡේද 05 කි. ගාථා 415 කි. , බුද්ධ චරිතය, ඛෙම නම් මහරහතන් වහන්සේ වම් දළදාව ගෙන කළිගු රට බ්‍රහ්මදත්ත රජුට බාරදීම, පණ්ඩු ගුහසීව රජවරු දන්ත ධාතුන් වහන්සේට හිරිහැර පැමිණවීම, දළදා ප්‍රාතිහාර්ය, දළදා වහන්සේ දන්ත පුරයට බාරදීම, හේමමාලා කුමරිය හා දන්ත කුමරු දළදා වහන්සේ ලක්දිවට වැඩමවීම ආදී විස්තර ඇතුළත් ය.

(ඉ) ජිනචරිතය

කර්තෘ - විජයබාහු පරිවෙණාධිපතිව වැඩවිසූ මේධංකර නම් තෙර නමකි.

කාලය - පොළොන්නරු යුගය

අන්තර්ගතය - දීපංකර පාද මූලයෙහි නියත විවරණ ලැබීමේ පටන් ගෞතම බුද්ධ චරිතය විස්තර වන මෙහි ගථා 473ක් පමණ ඇතුළත්ය. වෙස්සන්තර භවයේ අඹු දරුවන් දන්දීම, තුසිත දෙව්ලොව ඉපදීම, පස්මහ බැලුම් බැලීම, මව්කුස පිළිසිඳ ගැනීම, උපත දා සිදුවූ අසිරිමත් සිද්ධි, අභිනිෂ්ක්‍රමණය, බුද්ධත්වය ලැබීම, දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කිරීම හා පන්සාලිස් වසක් මුලුල්ලෙහි දම් දෙසීම ආදී බුද්ධ චරිතය සම්බන්ධ සියලු කරුණු වර්ණනාත්මකව දක්වා ඇත.

(ඊ) රසවාහිනිය

කර්තෘ - ආනන්ද වනරතන හිමියන්ගේ ශිෂ්‍ය සමන්තකූටවණ්ණනා නම් ග්‍රන්ථය කළ වෙදේහ නම් තෙර නමකි.

කාලය - පොළොන්නරු යුගය

අන්තර්ගතය - මෙහි දඹදිව කථා 40ක් ද ලක්දිව කථා 63ක් ද ඇතුළත්ය. බණ ඇසීමේ අනුසස්, දන්දීමේ අනුසස් දැක්වීම අරමුණු කොට මෙම ග්‍රන්ථය සම්පාදනය කර ඇත. දඹදිව කථාවලින් වැඩි හරියක් බුද්ධ පරිනිර්වානයෙන් පසුව ඇති වූ සිද්ධීන්ය. ලක්දිව කථාවල වැඩිපුර දැකිය හැක්කේ ඓතිහාසික සිද්ධීන්ය. දසමහායෝධයන්ගේ කථා සවිස්තරව දැක්වේ. ව්‍යක්ත පාලි භාෂාවෙන් ලියා ඇති මෙය ඉතා වටිනා ධර්ම ග්‍රන්ථයකි.

## ලකුණු දීමේ ක්‍රමය

(ලකුණු 2+4+6+8 = 20)

(i) නිවැරදි ව සූත්‍ර 4ක් දැක්වීමට ලකුණු භාගය බැගින් **ලකුණු 2ක්** පිරිනමන්න.

(ii) එක්කෘතියක් නම් කිරීමට **ලකුණු** 01 බැගින් **ලකුණු 04 ක්** පිරිනමන්න.

(iii) අදාළ කරුණු 3ක් පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

(iv) නිවැරදි හා පූර්ණ හැඳින්වීමකට **ලකුණු** 04 බැගින් හිමි වේ. කර්තෘ හා කාලය නිවැරදි ව දක්වා ඇත්නම් **ලකුණු** 2 ක් ද අන්තර්ගතය සඳහා **ලකුණු** 2 ක් ද වශයෙන් සලකන්න.

5. (i) "සබ්බත්ථ වෙ සප්පුරිසා වජන්ති - න කාමකාමා ලපයන්ති සන්තො,
සුඛෙන ඵුට්ඨා අථ වා දුඛෙන - නොච්චාවචං පණ්ඩිතා දස්සයන්ති."
මෙම ගාථාව ඇසුරෙන් බුද්ධිමත් පුද්ගලයකුගේ චරිත විශේෂතා පිළිබඳ ව විවරණයක් කරන්න.

(ii) "යො හි පස්සති සද්ධම්මං, සො මං පස්සති පණ්ඩිතො" මෙහි ධර්මානුකූල අදහස පැහැදිලි කරන්න.

(iii) අතීතයේ ශ්‍රී ලංකාව හා භාරතය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ගොඩනැගී ඇති ආකාරය මහාවංසය ඇසුරෙන් පෙන්වා දෙන්න.

(iv) අපායසහායක අමිත්‍රයාගේ ගති ලක්ෂණ ප්‍රකට කරන්න.

(ලකුණු 5+5+5+5 =20)

---

5. ආදර්ශ පිළිතුර

(i) සබ්බත්ථ වෙ සප්පුරිසා වජන්තී න කාමකාමා ලපයන්ති සන්තො
සුඛෙන ඵුට්ඨා අථ වා දුඛෙන න උච්චාවචං පණ්ඩිතා දස්සයන්ති

බුද්ධිමත් පුද්ගලයා කිසිම දෙයෙක්හි නොඇලීම, ඒ ඒ මනාප දෑ ලබාගන්නා අදහසින් අනුන් සිත් ගන්නා තෙපුල් නොකිම, අනුන් ලවාද නොකියවීම, නුවණැත්තෝ සැපේදී මෙන්ම දුකේදීත් උස් පහත් ගති නොදැක්වීම, යන කරුණු ඇසුරින් විවරණයක් ඇතුළත් විය යුතු ය.

(ii) යො හි පස්සති සද්ධම්මං සො මං පස්සති පණ්ඩිතො යන්නෙන් අර්ථවත් වන්නේ, යම් පණ්ඩිතයෙක් සද්ධර්මය දකී නම් හෙතෙම බුදුන් දකී යන්නයි. බුදුන් දැකීම ඉන්ද්‍රියගෝචරව නොව අවබෝධයෙන් කළ යුතු බව මින් කියවේ. බුද්ධ චරිතය බුද්ධ ධර්මයේ ජීවමාන ප්‍රතිමූර්තියයි. නුගත් ජනයන් තුළ ඇති භක්තිය නිසා ධර්මය අවබෝධ කළ නොහැකිය. ධර්මය අවබෝධ කළ හැක්කේ ගුණ ධර්ම ප්‍රගුණ කිරීමෙනි. වක්කලි තෙරුන්ට බුදුන් වදාළේ කුණු කය දෙස අන්ධ භක්තියෙන් බලා සිටීමෙන් බුදුන් දැකිය නොහැකි බවයි. බුදුන් වදාළ චතුරාර්ය සත්‍යය අවිපරීත ලෙස අවබෝධ කර ගැනීමෙන් බුදුන් පිළිබඳ අවිපරීත අවබෝධයක් ලබා ගත හැකි බව මෙමගින් අවධාරණය වෙයි.

(iii) අසල්වැසි රාජ්‍යයන් සමග පැවති රාජ්‍යය සබඳතා රාශියක් මහාවංශයේ ඇතුළත්ය. 11 වන පරිච්ඡේදයේ සඳහන් පරිදි දේවානම්පියතිස්ස රජු හා අශෝකාධිරාජයා අතර පැවති සබඳතා කීපයක් පහත දැක්වේ.

- රාජ්‍යය තාන්ත්‍රික දූතයන් යැවීම
- තුටු පඬුරු හුවමාරු කර ගැනීම
- දූතයන්ට තනතුරු හා වරප්‍රසාද පිරිනැමීම
- ආර්ථික හා සංස්කෘතික දෑ හුවමාරු කර ගැනීම
- සුහදව හා මිත්‍රශීලීව කටයුතු කිරීම යනාදී රාජ්‍යය තාන්ත්‍රික සබඳතා ගොඩනැගී ඇති ආකාරය විස්තර විය යුතුය.

(iv) අපාය සහාය මිත්‍රයා පහත සඳහන් ගති ලක්ෂණවලින් යුක්ත වෙයි.

i සුරාමෙරය මජ්ජපමාදට්ඨානුයොගෙ සහයො හොති,

ii විකාල විසිඛාචරියානුයොගෙ සහායො හොති,

iii සමජ්ජාභිචරණෙ සහයො හොති,

iv ජූතප්පමාදට්ඨානුයොගෙ සහයො හොති, මෙම ගති විස්තර කර තිබිය යුතුය.

**ලකුණුදීමේ ක්‍රමය**

(ලකුණු 5+5+5+5 = 20)

(i) ආදර්ශ පිළිතුරේ ඇති කරුණු ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

(ii) නිවැරදි අදහස පැහැදිලි කිරීමට සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

(iii) රාජ්‍යය තාන්ත්‍රික සබඳතා 5ක් වත් විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

(iv) අදාළ කරුණු ඇසුරෙන් විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

---

## III කොටස

**6.** (i) පහත දැක්වෙන පදවල තේරුම ලියා දක්වන්න.

(අ) අජ්ජතග්ගෙ
(ආ) අත්‍රජො
(ඉ) චතුධා
(ඊ) උස්සූරසෙය්‍යො
(උ) කායබන්ධනං
(ඌ) තොයෙන
(එ) ඝාපිතා
(ඒ) දිවාසොප්පං
(ඔ) සාපතෙය්‍යං
(ඕ) ස්වාගතං

(ii) පහත වචනවලට නිර්දිෂ්ට ග්‍රන්ථවල ඇති **පාලි යෙදුම** දක්වන්න.

(අ) අත් පිස්නාව
(ආ) උපාධ්‍යායන් වහන්සේ
(ඉ) ඇහැටි දඬු
(ඊ) දූවිලි සහිත සුළඟ
(උ) පඬුරු
(ඌ) බැණා
(එ) මිත්‍ර ප්‍රතිරූපකයෝ
(ඒ) යට දිශාව
(ඔ) වල්විදුනාව
(ඕ) හිවළා

(iii) පහත ක්‍රියා රූපවල අඛ්‍යාත විභක්තිය, පුරුෂය හා වචනය නම් කරන්න.
උදාහරණ:- **භවති** - වත්තමානා, පඨමපුරිස, ඒකවචන

(අ) ආරොචෙසිං
(ආ) ඔවදෙය්‍ය
(ඉ) නමස්සසි
(ඊ) නයන්ති
(උ) තිට්ඨතු

---

(iv) පහත නාම පදයන්හි **ශබ්ද ප්‍රකෘතිය** හා **විභක්තිය** නම් කරන්න.

(අ) අම්භාකං
(ආ) එතාදිසො
(ඉ) ගච්ඡන්තං
(ඊ) ගොතමස්ස
(උ) පරිසායං
(ඌ) භික්ඛවෙ
(එ) මහෙසිනො
(ඒ) මෙධාවිං
(ඔ) සීලවා
(ඕ) හංසවතියං

(ලකුණු 5+5+5+5 =20)

**ආදර්ශ පිළිතුර**

(i) පහත දැක්වෙන පදවල තේරුම ලියා දක්වන්න.

(අ). අජ්ජතග්ගෙ- අදපටන්
(ආ). අත්‍රජො - පුතා
(ඉ). චතුධා -සතර කඩකට
(ඊ). උස්සූරසෙය්‍යා - ඉර උදාවනතුරු නිදාගන්නා තැනැත්තා
(ඔ) සාපතෙය්‍යං - වස්තුව
(උ). කායබන්ධනං - පටිය
(ඌ). තොයෙන- ජලයෙන්
(එ). ඣාපිතා - දවනලද
(ඒ). දිවාසොප්පං - දහවල් නිදාගැනීම
(ඕ). ස්වාගතං - යහපත් පැමිණීමක්

(ii)

(අ). අත්පිස්නාව - හත්ථපුඤ්ඡනං
(ආ). උපාධ්‍යායන් වහන්සේ - උපජ්ඣායො
(ඉ). දැහැටි දඬු - දන්තකට්ඨං
(ඊ). දූවිලි සහිත සුළඟ -සරජා වාතා
(උ). පඬුරු - පණ්ණාකාරං
(ඌ). බෑණා - භාගිණෙය්‍යා
(එ). මිත්‍ර ප්‍රතිරූපකයෝ- මිත්තපතිරූපකා
(ඒ). යට දිසාව - හෙට්ඨිමං දිසං
(ඔ). වල්විදූනාව - වාලවිජනිං
(ඕ). හිවලා - සිගාලො

(iii)

| පදය | ආඛ්‍යාත විභක්තිය | පුරුෂය | වචනය |
|---|---|---|---|
| ආරොචෙසිං | අජ්ජතනී | උත්තම | එකවචන |
| ඔවදෙය්‍ය | සත්තමී | පඨම | එකවචන |
| නමස්සසි | වත්තමානා | මජ්ඣිම | එකවචන |
| නයන්ති | වත්තමානා | පඨම | බහුවචන |
| තිට්ඨතු | පංචමී | පඨම | එකවචන |

(iv)

| පදය | ශබ්ද ප්‍රකෘතිය | විභක්තිය |
|---|---|---|
| අම්හාකං | අම්හ | දුතියා චතුත්ථී ඡට්ඨී |
| එතාදිසො | එතාදිස | පඨමා |
| ගච්ඡන්තං | ගච්ඡන්ත | දුතියා |
| ගොතමස්ස | ගොතම | චතුත්ථී ඡට්ඨී |
| පරිසායං | පරිසා | සත්තමී |
| භික්ඛවෙ | භික්ඛු | ආලපන |
| මහෙසිනො | මහෙසි | චතුත්ථී ඡට්ඨී |
| මෙධාවිං | මෙධාවී | දුතියා |
| සීලවා | සීලවන්තු | පඨමා |
| හංසවතියං | හංසවතී | සත්තමී |

(ලකුණු 5+5+5+5 = 20)

**ලකුණුදීමේ ක්‍රමය**

I, II, III, IV කොටස්වල එක් නිවැරදි පිළිතුරකට **ලකුණු භාගය** (½) බැගින් පිරිනමන්න.

**7.** (i) "**තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය...**" යනාදි ගාථාව නිවැරදි අක්ෂර වින්‍යාසය හා පද බෙදීම් සහිත ව ලියා දක්වන්න.

(ii) පහත පාඨයන්හි හිස්තැන් දී ඇති පද යොදා සම්පූර්ණ කරන්න.
(ආපදාසු, බුද්දකො, සුක්කං, උපජ්ඣායෙන, අප්පෙන)

(අ) කණ්හං ධම්මං විප්පහාය, ................................ පණ්ඩිතො.

(ආ) ................................ භික්ඛවෙ සද්ධිවිහාරිකම්හි සම්මා වත්තිතබ්බං.

(ඉ) තදඤ්ඤං බුද්ධවචනං නිකායො ................................ මතො.

(ඊ) චතුත්ථං ච නිධාපෙය්‍ය, ................................ භවිස්සති.

(උ) අඤ්ඤදත්ථුහරො හොති, ........................ බහුම්පිජ්ජති.

(iii) පහත පදවලින් **දෙකකට** විවරණ සපයන්න.

(අ) අපායමුඛානි (ඉ) උභතො විභංග

(ආ) පෙය්‍යවජ්ජං (ඊ) ඡන්දාගති

(iv) මහාසුපින ජාතකයෙන් වර්තමාන සමාජයට ලබාදෙන උපදේශය කුමක්දැ'යි පෙන්වා දෙන්න.

(ලකුණු 5+5+5+5 =20)

ආදර්ශ පිළිතුර

(i) තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය, හිත්වා කාමෙ අකිඤ්චනො,
පරියොදපෙය්‍ය අත්තානං, චිත්තක්ලෙසෙහි පණ්ඩිතො.

(ii) (අ) කණ්හං ධම්මං විප්පහාය **සුක්කං භාවෙථ** පණ්ඩිතො

(ආ) **උපජ්ඣායෙන** භික්ඛවෙ සද්ධිවිහාරකම්හි සම්මා වත්තිතබ්බං

(ඉ) තදඤ්ඤං බුද්ධවචනං නිකායො **බුද්දකො** මතො

(ඊ) චතුත්ථං ච නිධාපෙය්‍ය **ආපදාසු** භවිස්සති

(උ) අඤ්ඤදත්ථුහරො හොති **අප්පෙන** බහුම්පිජ්ජති

(iii) (අ) අපායමුඛානි

අපායමුඛ නම් විනාශ මුඛයන්ය. සිගාලෝවාද සූත්‍රයෙහි භෝග විනාශමුඛයන් 6ක් දක්වා ඇත.

i සුරාපානය

ii නොකල්හි වීථි සංචාරය

iii නෘතය දර්ශනාදිය පිණිස යාම

iv දූ කෙළියෙහි යෙදීම

v පාපමිත්‍රයන් ඇසුරු කිරීම

vi අලසකම යන කරුණු හය ඇසුරෙන් පිළිතුරු සපයා තිබිය යුතුය.

(ආ) පෙය්‍යවජ්ජං

එනම් ප්‍රියවචන කථා කිරීමයි. පුරවැසියන් භාවිත කරන කණට මිහිරි අසභ්‍ය නොවූ ග්‍රාම්‍ය නොවූ වචන භාවිත කිරීමයි. මුසාවාද පිසුණාවාච ඵරුසාවාච සම්පප්ඵලාපාදි වාක් දෝෂයන්ගෙන් වැලකී කථා කිරීම ද පෙය්‍යවජ්ජ නම් වේ. මෙම කරුණු විවරණය කර තිබීම අවශ්‍ය වෙයි.

(ඉ) උභතො විභංග

උභතො විභංග යනු භික්ඛු හා භික්ඛුනී විභංගයන්ය. විනය පිටකයේ පාරාජිකපාළි හා පාචිත්තියපාළි ග්‍රන්ථයන් විභංග ගණයට අයත් වේ. ඒ අනුව භික්ඛු විභංගයට ශික්ෂාපද 227ක් ද භික්ඛුනී විභංගයට ශික්ෂාපද 311ක් ද අයත් වේ. මෙම කරුණු විවරණය කර තිබීම අවශ්‍ය වෙයි.

(ඊ) ඡන්දාගති

සතර අගති අතුරෙන් පළමු වැන්නයි. ඥාති වන බැවින් හෝ මිත්‍ර වන බැවින් හෝ රාගය නිසා හෝ පුද්ගලයා ඡන්දයෙන් අගතියට යයි. රජවරුනට විනිශ්චය කරුවනට අගතිගාමී වීම හොඳ නැත.මෙම කරුණු විවරණය කර තිබීම අවශ්‍යය වෙයි.

(iv) මහාසුපින ජාතකයෙන් වර්තමාන සමාජයට ලබාදෙන උපදේශ රාශියකි. ප්‍රධාන වශයෙන් රජු අධාර්මිකවීමෙන් රට ජනතාව පමණක් නොව ස්වභාව ධර්මය පවා අයහපත් වන බව මෙහි විස්තර වෙයි. පාලකයන් අන්ධ විශ්වාසයන් පසු පස යාමෙන් මහත් විපත් සිදුවන බව, රාජ්‍යය නිලධාරීන් ආත්මාර්ථයෙන් කටයුතු කිරීම මහජනයා විපතට පත් කරන බව (බහුං ධනං ලභිස්සාම බහුං බජ්ජභොජ්ජං ආහරාපෙස්සාම), තම සැමියා යහ මගට ගැනීම යහපත් නුවණැති බිරියකගේ කාර්යයක් බව (මල්ලිකා දේවිය රජතුමා බුදුන් වෙත යොමු කිරීම), අධාර්මික පාලකයන් නිසා රටෙහි ස්වභාවධර්මය ප්‍රකෝප වන බව (වෘෂභ යුද්ධය පිළිබඳ සිහිනය), තරුණ නොදැහැමි අයට රාජ්‍යයේ විනිශ්චයාසන වැනි තනතුරු දීමෙන් එම රජය පිරිහෙන බව (තරුණ ගොන් වස්සන් වියගස්හි බැඳීම), අසද්ධර්මයෙන් යුතු බිරිය නිසා එම ගෘහය විනාශ වන බව (රැහැන කන සිවලිය), මුදලට බණ විකිණීම නොකළ යුතු බව (ලක්ෂයක් වටිනා සඳුන් හර කුණු මෝරුවලට විකිණීම), සුදුස්සාට සුදුසු තනතුරු නොදීම නිසා දේශපාලනික හා ආගමික සංස්ථා පිරිහෙන බව (හිස් ලබු කබල් ජලයේ පාවීම), එකෙකු මරා තව කෙනෙකුට සෙතක් කිරීම නොකළ හැකි බව, තමා හෝ රජය විපතට පත්වූ විට විශේෂඥ උපදෙස් පැතීම උතුමන්ගේ ක්‍රියාවක් බව යන කරුණු ඇසුරෙන් පිළිතුරු සපයා තිබිය යුතුය.

**ලකුණු දීමේ ක්‍රමය**

(ලකුණු 5+5+5+5 = 20)

(i) ගාථාව නිවැරදි ව පද බෙදීම් සහිතව ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න. එක් වරදකට ලකුණු භාගය බැගින් අඩු කරන්න.

(ii) අදාළ පද නිවැරදි ව ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

(iii) එක් පදයක් නිවැරදි ව විවරණය කිරීමට **ලකුණු** 2½ බැගින් පිරිනමන්න.

(iv) අදාළ උපදේශය ජාතක කථාවේ කරුණු ඇසුරෙන් විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.